# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2054/32 – 2018 ජනවාරි 17 වැනි බදාදා – 2018.01.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2018 අංක 16 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2017/එච්ඩබ්ලිව්/09.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 3/ඉ/අත්පත්/1/11/වෙළුම/විල්ගමුව.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2018 ජනවාරි මස 10 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, අලව්ව.

2. **ඉඩමේ විස්තරය.–** වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 989, විල්ගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, විල්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේයූ/ඒඑල්ඩබ්ලිව්/2016/744 සහ 2016.11.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අංක 01 – කොලොන්ගහමුලහේන – ප්‍රමාණය: හෙක්. 0.3521**
උතුරට: කේ. ආර්. කරුණාරත්න හිමිකම් කියන කොලොන්ගහමුලහේන; නැගෙනහිරට: කේ. ආර්. කරුණාරත්න හිමිකම් කියන කොලොන්ගහමුලහේන සහ ඇඹිල්ලගහමුලහේන; දකුණට: කැබලි අංක 2, මාර්ගය සහ එච්. එම්. පී. කුමාරි හේරත් සහ එච්. එම්. එන්. කුමාරි හේරත් හිමිකම් කියන බෙලිවලගාව හේන සහ ගොඩැල්ලපිටහේන; බටහිරට: එච්. එම්. පී. කුමාරි හේරත් සහ එච්. එම්. එන්. කුමාරි හේරත් හිමිකම් කියන බෙලිවලගාව හේන.

02. **කැබලි අංක 02 – ඇඹිල්ලගහමුලහේන – ප්‍රමාණය: හෙක්. 0.1011**
උතුරට: කැබලි අංක 1; නැගෙනහිරට සහ දකුණට: කේ. ආර්. කරුණාරත්න හිමිකම් කියන ඇඹිල්ලගහමුලහේන; බටහිරට: මාර්ගය.

02 – 104